4 මූල්‍ය ප්‍රකාශ ආශ්‍රිත ගැළපුම්

මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන තේමා පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

4.1 වියදම් හා ආදායම්වල ස්වභාවය

4.2 ගිණුම් කාලච්ඡේදයකට අදාළ ආදායම් සහ වියදම් ගැළපීම

4.3 නිවැරදි තොරතුරු අනාවරණය සඳහා ණය ගැති ශේෂ ගැළපීම

4.4 ස්ථාවර වත්කම්වල වටිනාකම යාවත්කාලීන කිරීම

මූල්‍ය ප්‍රකාශ ආශ්‍රිත ගැළපුම් සටහන් පිළියෙල කරමු

තනි ව්‍යාපාරයක් පවත්වා ගෙන යන කෝසල මහතා මනා ලෙස ගිණුම් පොත් පත් පවත්වා ගෙන නොගියද ව්‍යාපාරයේ ආදායම් සහ වියදම් ඇතුළු සියලු ම ගනුදෙනු පොතක සටහන් කර ගත්තේය. ඔහු ව්‍යාපාරයේ ලාභය ගණනය කර ගන්නා ලද්දේ මුදලින් ලැබූ ආදායම්වලින් ගෙවූ වියදම් අඩු කිරීමෙනි. නමුත් ගිණුම්කරණය පිළිබඳ පළපුරුද්දක් ඇති තම ඥාතියකු සමග කෝසල කරන ලද සාකච්ඡාවක දී ලාභය ගණනය කිරීම කෙරෙහි පහත දැක්වෙන කරුණු පිළිබඳව ද සැලකිලිමත් විය යුතු බව කෝසලට අවබෝධ විය.

- ❋ සියලු ම වියදම් හා ආදායම් ලාභය ගණනය කිරීමට අදාළ නොවන බව
- ❋ නිශ්චිත කාලපරිච්ඡේදයකට අදාළ වියදම් හා ආදායම් පමණක් සැලකිල්ලට ගත යුතු බව
- ❋ ගනුදෙනුකරුවන්ගෙන් ස්ථිර වශයෙන්ම නො ලැබෙන ණය කපා හැරිය යුතු බව
- ❋ ස්ථාවර වත්කම්වලට දරණ ලද වියදම වාර්ෂික ව කපා හැරිය යුතු බව

ඉහත සඳහන් කොටස කියවූ ඔබට ව්‍යාපාරයක නිවැරදි ලාභය ගණනය කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් ඇති බව පෙනී යන්නට ඇත.

ව්‍යාපාරයක ලාභය හා මූල්‍ය තත්ත්වය නිවැරදි ව ගණනය කිරීමට අවශ්‍ය වන එහෙත් ගිණුම්වලට ඇතුළත් නොවූ සටහන් ඇතුළත් කරනු ලබන ආකාරය විමසා බලමු.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

හැඳින්වීම

යම් කාලපරිච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයක කටයුතුවලින් ලත් ප්‍රතිඵල ගණනය කිරීමේ දී එය නිවැරදි ව සිදු කිරීම ඉතා වැදගත් වේ. ඒ තුළින් අදාළ පාර්ශ්වයන්ට නිවැරදි තොරතුරු සැපයීමටත්, අදාළ නිවැරදි තීරණ ගැනීමටත් හැකියාව ලැබේ. ඒ සඳහා අදාළ වියදම් හා ආදායම් හඳුනා ගැනීමට උපචිත වියදම් හා උපචිත ආදායම්, පෙර ගෙවුම් හා ලැබීම්, බොල් ණය හා ස්ථාවර වත්කම් ක්ෂය ගැළපීම් කිරීමට සිදු වේ. මෙම පරිච්ඡේදය තුළින් එම ගැළපීම් නිවැරදි ව හඳුනාගෙන ඒවා ජ'නල් ගත කිරීම හා ලෙජර ගිණුම්වල සටහන් කිරීම පිළිබඳ ව ඔබට පැහැදිලිවනු ඇත.

මෙම පරිච්ඡේදයේ දී පහත සඳහන් මූලික යෙදුම් පිළිබඳ ඔබගේ අවධානය යොමු කෙරේ.

- ප්‍රාග්ධන වියදම්
- අයභාර වියදම්
- අයභාරය
- උපචිත ආදායම්
- උපචිත වියදම්
- පෙර ගෙවීම්
- පෙර ලැබීම්
- බොල් ණය
- ස්ථාවර වත්කම් ක්ෂය
- සරල මාර්ග ක්ෂය ක්‍රමය

4.1 වියදම් හා ආදායම්වල ස්වභාවය

ව්‍යාපාරයක් පිළිබඳ ව උනන්දුවක් දක්වන පාර්ශ්ව ගණනාවක් සිටින අතර, ගනුදෙනු ක්‍රමානුකූලව සටහන් කර තැබීමෙන් එම කණ්ඩායම්වලට විවිධ ප්‍රයෝජන අත්වේ. මෙම කණ්ඩායම් ව්‍යාපාරයකට සම්බන්ධ ප්‍රධාන කරුණු දෙකක් පිළිබඳව උනන්දුවක් දක්වයි. යම් කාලපරිච්ඡේදයක් තුළ දී ව්‍යාපාරයේ කටයුතුවලින් ලද මෙහෙයුම් ප්‍රතිඵලය මේවායින් එක් කරුණකි. අනෙක් කරුණ නම් ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වයයි.

මෙම කරුණු නිවැරදි ව අනාවරණය කර ගැනීම සඳහා මූලික වශයෙන් ඉවහල් වන වියදම් හා ආදායම්වල ස්වභාවය අවබෝධ කර ගැනීම අතිශයින් වැදගත්වේ.

සෑම ව්‍යාපාරයකට ම එදිනෙදා කටයුතුවල දී විවිධ වියදම් දැරීමට සිදු වේ. මෙවැනි වියදම් දරනුයේ යම් කිසි ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙනි. එම වියදම් නිසා ඇති වන ප්‍රතිලාභ, ඒවා දරනු ලැබූ ගිණුම් කාලච්ඡේදය තුළ දී ම හෝ ඉදිරි කාලපරිච්ඡේද ගණනාවක් තුළ දී හෝ ලැබීමට පුලුවන. එම ස්වභාවය අනුව වියදම් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.



ප්‍රාග්ධන වියදම් (Capital Expenditure)

යම්කිසි වියදමක් නිසා ඇති වන ප්‍රතිලාභ දිගු කාලයක් තුළ ලැබේ නම් එවැනි වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස හඳුන්වනු ලැබේ. මෙහි දී දිගු කාලය යනුවෙන් අදහස් කරන්නේ ගිණුම් වර්ෂයකට වඩා වැඩි කාල සීමාවක් වේ. බොහෝ විට මෙවැනි වියදම් මගින් වර්ෂ ගණනාවක් යන තුරු ව්‍යාපාරික ප්‍රතිලාභ ලැබේ.

නිදසුන් - රෙදිපිළි මිලට ගෙන අලෙවි කරනු ලබන ව්‍යාපාරයකට මෝටර් රථයක් අත්පත් කර ගැනීම.

මෙම මෝටර් රථය වර්ෂ කිහිපයක් ව්‍යාපාරික කටයුතුවල යෙදවීමෙන් ප්‍රතිලාභ අත්කර ගත හැකි ය. මෙවැනි වියදම් තුළින් ව්‍යාපාරයක ජංගම නොවන වත්කම් බිහි වේ. පහත සඳහන් රූප සටහන නිරීක්ෂණය කරන්න.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

4.1 රෙදිපිළි නිෂ්පාදනය සහ බෙදාහරින ව්‍යාපාරයක ස්ථාවර වත්කම්

අයභාර වියදම් (Revenue Expenditure)

යම් කිසි වියදමක් නිසා ඇති වන ප්‍රතිලාභ කෙටි කාලයක් තුළ දී ව්‍යාපාරයකට ලැබේ නම් ඒවා අයභාර වියදම් ලෙස හැඳින්වේ. මෙහි දී කෙටි කාලය යනුවෙන් අදහස් කරනු ලබන්නේ ගිණුම් වර්ෂයක් හෝ ඊට වඩා අඩු කාලයක් ය. ව්‍යාපාරයක එදිනෙද ව්‍යාපාරික කටයුතුවලට අදාළ ව ඇති වන වියදම් මේ ගණයට අයත් වේ.

ව්‍යාපාරයක සිදු විය හැකි අයභාර වියදම්වලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- රක්ෂණය, විදුලිය, දුරකථන, වරිපනම්
- ප්‍රවාහන, ප්‍රචාරණ, විකුණුම් කොමිස්
- ණය පොලී, බැංකු ගාස්තු

අයභාරය (Revenue)

භාණ්ඩ විකිණීමෙන් හෝ සේවා සැපයීමෙන් හෝ ව්‍යාපාරයක් විසින් උපයනු ලබන ආදායම් අයභාරය නම් වේ.

ක්‍රියාකාරකම 01

උපමාලි රෙදි මිලට ගෙන ඇඳුම් මසා විකිණීමේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා 20xx.01.01 දින රු. 500,000කට ගොඩනැගිල්ලක් මිලට ගත්තා ය. රෙදි මහන මැෂින් 4ක් මිලට ගත් අතර ඒ සඳහා වැය වූ මුදල රු. 100,000ක් විය. ව්‍යාපාරයේ කටයුතු සඳහා සේවිකාවන් දෙදෙනකු ද බඳවා ගත් අතර 20xx වර්ෂය සඳහා වැටුප් ලෙස රු. 200,000ක් ද ගෙවන ලදී. රෙදි, නූල් ආදී දෑ මිලට ගැනීමට රු. 300,000ක් වැය කරන ලදී. ව්‍යාපාරික කටයුතු කර ගෙන යන අතරතුර විදුලි වියදම් ලෙස රු. 10,500ක් ද, රක්ෂණ ගාස්තු ලෙස රුපියල් 6,500ක් ද වැය විය. වර්ෂය අවසානයේ මසා නිම කළ ඇඳුම් විකිණීමෙන් රු.950,000ක ආදායමක් ලැබී ය.

ඉහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ව්‍යාපාරයේ,

i. ප්‍රාග්ධන වියදම්

ii. අයභාර වියදම් ගණනය කරන්න.

මීළගට මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී ගිණුම් කාලච්ඡේදයට අදළ ආදායම් හා වියදම් ගළපන ආකාරය පිළිබඳ ව සොයා බලමු.

4.2 ගිණුම් කාලච්ඡේදයකට අදළ ආදායම් සහ වියදම් ගැළපීම

යම් කාලච්ඡේදයකට අදළ සෑම ගනුදෙනුවක් ම ගිණුම් පොත්වල සටහන් කිරීම අත්‍යවශ්‍ය වේ. එහෙත් ගිණුම් කාලච්ඡේදය අවසන් වන විට ඒ කාලච්ඡේදයට අදළ ඇතැම් ගනුදෙනු ගිණුම් පොත්වල බොහෝ විට ඇතුළත් නොවී තිබිය හැකි ය. එම ගනුදෙනු ගිණුම් පොත්වල ඇතුළත් කිරීම සඳහා උපයෝගී කරනු ලබන සටහන් **ගැළපුම් සටහන්** නම් වේ. මේ ගැළපුම් කෙරෙන්නේ, පොදු ජ'නලයේ ඇතුළත් කෙරෙන ජ'නල් සටහන් මගිනි. ගිණුම් කාලච්ඡේදයක් අවසානයේ දී සිදු කෙරෙන එවැනි ගැළපුම් කිහිපයක් පහත දක්වේ.

- උපචිත වියදම් හා උපචිත ආදායම්
- පෙර ගෙවුම් හා පෙර ලැබීම්
- බොල් ණය
- ස්ථාවර වත්කම් ක්ෂය

ගිණුම්කරණ තොරතුරු ඉදිරිපත් කිරීමේ දී සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්ම මත ඒවා සිදු කෙරේ. එසේම ගිණුම්කරණයට පදනම් වී ඇති සංකල්ප කිහිපයක් ද වේ. මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී වැදගත් වන එවැනි සංකල්පයක් ලෙස උපචිත සංකල්පය හැඳින්විය හැකි ය.

උපචිත සංකල්පය (Accrual Concept)

ගිණුම් කාල පරිච්ඡේදය තුළ දී ව්‍යාපාරය විසින් ලබාගෙන ඇති සේවා වෙනුවෙන් නොගෙවා ඇති වියදම් ද ගිණුම් වර්ෂය තුළ දී ව්‍යාපාරය විසින් සපයා ඇති සේවා වෙනුවෙන් නොලැබී ඇති ආදායම් ද, මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කිරීමේ දී සැලකිල්ලට

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ගත යුතු බව උපචිත සංකල්පයෙන් අදහස් කෙරේ. ඒවා කාලච්ඡේදයකට අදළ ව මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කළ යුතු ය. පෙර ගෙවුම් මෙන් ම පෙර ලැබීම් සඳහා ද මෙම ප්‍රතිපත්තිය ම අනුගමනය කළ යුතු වේ.

උපචිත වියදම්

ගිණුම් කාල පරිච්ඡේදයට අදළ නමුත් එම කාලපරිච්ඡේදය තුළ ගෙවා නැති වියදම්, **උපචිත වියදම්** ලෙස හැඳින්වේ.

නිදසුන් සඳමාලි විසින් රෙදිපිළි මිලට ගෙන විකිණීම සඳහා 20xx.01.01 දින රු. 125,000ක් ගෙවා ගොඩනැගිල්ලක් කුලියට ගන්නා ලදී. මේ සඳහා වාර්ෂික ව ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය රු.150,000කි. අවසාන ගිණුම් සකස් කරන 20xx.12.31 දිනය වන විට ගෙවා ඇත්තේ රු. 125,000ක් පමණි.

උපචිත ගොඩනැගිලි කුලී ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ජ'නල සටහන් ද ලෙජර ගිණුම් ද පහත දක්වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
XX.12.31		ගොඩනැගිලි කුලී ගිණුම හර උපචිත ගොඩනැගිලි කුලී ගිණුම (උපචිත ගොඩනැගිලි කුලී ගිණුම් ගත කිරීම.)		25,000	25,000

හර **ගොඩනැගිලි කුලී ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
XX.01.01	මුදල්		125,000				
XX.12.31	උපචිත ගොඩනැගිලි කුලී		25,000				

හර **උපචිත ගොඩනැගිලි කුලී ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
				XX.12.31	ගොඩනැගිලි කුලී ගිණුම		25,000

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඉහත නිදසුන අනුව ගොඩනැගිලි කුලී ගිණුමට මෙතෙක් නොගෙවා ඇති රුපියල් 25,000ක් හර කර ඇත. එය ගිණුම් කාලච්ඡේදයට අදළ නිසාත් වියදම් ගිණුමේ වැඩි වීමක් සිදු වන නිසාත් එසේ හර කර ඇත.

උපචිත ගොඩනැගිලි කුලී තවමත් නොගෙවා ඇති බැවින් එය වගකීමක් ලෙස සලකන අතර වගකීම් වැඩි වීම නිසා එම ගිණුමට බැර කර ඇත.

උපචිත ආදයම්

ගිණුම් කාලච්ඡේදයට අදළ නමුත් එම කාලච්ඡේදය තුළ ලැබී නැති ආදයම් **උපචිත ආදයම්** ලෙස හැඳින්වේ.

නිදසුන් 20xx.01.01 දින සඳමාලිගේ ව්‍යාපාරය වර්ෂයකට 16% බැගින් මාස්පතා පොලී ලැබීමේ පදනම යටතේ බැංකුවක ස්ථාවර තැන්පතු වශයෙන් රුපියල් 240,000ක් ආයෝජනය කර ඇත. 20xx.12.31 දිනෙන් අවසන් වර්ෂයේ අවසාන මාසය සඳහා වූ පොලිය දෙසැම්බර් 31 දින වන විට ලැබී නොතිබුණි.

ලැබිය යුතු ආදයම ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය ජ'නල සටහන් ද ලෙජර ගිණුම් ද පහත දක්වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
xx.12.31		ලැබිය යුතු පොලී ආදයම් ගිණුම හර පොලී ආදයම් ගිණුම (ලැබිය යුතු පොලී ආදයම ගිණුම් ගත කිරීම.)		3,200	3,200

හර **පොලී ආදයම් ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
				xx.12.01	මුදල්		35,200
				xx.12.31	උපචිත පොලී ආදයම්		32,00

හර **ලැබිය යුතු පොලී ආදයම් ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
xx.12.31	පොලී ආදයම්		3,200				

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ඉහත නිදසුන අනුව පොලී ආදායම් ගිණුමට මෙතෙක් නොලැබී ඇති රුපියල් 3,200ක් බැර කර ඇත. එය ගිණුම් කාලච්ඡේදයට අදාළ නිසාත්, ආදායම් ගිණුමේ වැඩි වීමක් සිදු වන නිසාත්, එසේ බැර කර ඇත.

ලැබිය යුතු පොලී ආදායම තවමත් නොලැබී ඇති බැවින් එය වත්කමක් ලෙස සලකන අතර වත්කම් වැඩි වීම නිසා එම ගිණුමට හර කර ඇත.

පෙර ගෙවුම්

ඇතැම් විට ව්‍යාපාරයක් නියමිත ගිණුම් කාලච්ඡේදයට අදාළ වියදම් ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙවීම් කර තිබීමට පුළුවන. මෙසේ ඉදිරි ගිණුම් කාලච්ඡේදයට අදාළ වියදමක් මෙම ගිණුම් කාලච්ඡේදය තුළ දී ගෙවා ඇත්නම් එය පෙර ගෙවුම් හෙවත් ඉදිරියට කළ ගෙවුම් ලෙස හඳුන්වයි.

නිදසුන් 20xx වර්ෂය සඳහා සඳමාලිගේ ව්‍යාපාරය ගෙවිය යුතු රක්ෂණ වාරිකය රු. 5,600කි. එහෙත් 20xx ජනවාරි 01 දින ඇය රු. 6,000ක් රක්ෂණ ගාස්තු ලෙස ගෙවා ඇත. ඉදිරියට ගෙවන ලද රක්ෂණ ගාස්තු ගැළපීමට අදාළ ජ'නල සටහන හා අදාළ ලෙජර ගිණුම් ද පහත දැක්වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
XX.12.31		ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු ගිණුම හර රක්ෂණ ගාස්තු ගිණුම (ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු ගැළපීම.)		400	400

හර **රක්ෂණ ගාස්තු ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
XX.01.01	මුදල්		6,000	XX.12.31	ඉ.ගෙ. රක්ෂණ ගාස්තු		400

හර **ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
XX.12.31	රක්ෂණ ගාස්තු		400				

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ඉහත නිදසුන අනුව ඉදිරියට කළ රක්ෂණ ගාස්තු නිසා එම ගිණුමේ හර පැත්තේ දක්වෙන ප්‍රමාණය ගිණුම් කාලච්ඡේදයට අදළ රක්ෂණ වියදමට වඩා වැඩිය. එම නිසා ඉදිරියට ගෙවූ ප්‍රමාණය ඉවත් කළ යුතු වේ. එය රක්ෂණ වියදමේ වූ අඩු වීමක් නිසා එම ගිණුමට බැර කර ඇත. ඊට අදළ හර සටහන දක්වීම සඳහා ඉදිරියට ගෙවූ රක්ෂණ ගාස්තු ලෙස නව ගිණුමක් විවෘත කර ඇත. එය වත්කමක් බව ඔබට පැහැදිලි වනු ඇත.

පෙර ලැබීම්

ව්‍යාපාරයකට ගිණුම් කාලච්ඡේදය තුළ දී ලැබූ ආදායම්වලින් කොටසක් ඉදිරි ගිණුම් කාලච්ඡේදයට ද අදළ විය හැකි ය. මෙලෙස ගිණුම් වර්ෂය තුළ ලැබී ඇති ආදායම් තුළ ඉදිරි වර්ෂය සඳහා ලැබී ඇති ආදායම් ප්‍රමාණය පෙර ලැබීම් හෙවත් ඉදිරියට ලද ආදායම් ලෙස හැඳින්වේ.

නිදසුන් සඳමාලිගේ ව්‍යාපාරය ප්‍රචාරණ සේවා කටයුතු ද ආරම්භ කළ අතර, විවිධ ගනුදෙනු කරුවන්ගේ ප්‍රචාරණ දැන්වීම් සඳහා 20xx.03.01 දින දී රු. 750,000ක් ලැබී ඇත. මෙයින් රු. 50,000ක් ඉදිරි වර්ෂයේ දී ප්‍රචාරණය කළ යුතු දැන්වීම් සඳහා ය.

ඉදිරියට ලැබූ ප්‍රචාරණ ආදායම් ගැළපීමට අදළ ජ'නල සටහන හා අදළ ලෙජර ගිණුම් ද පහත දක්වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
XX.12.31		ප්‍රචාරණ ආදායම් ගිණුම හර ඉදිරියට ලැබූ ප්‍රචාරණ ආදායම් ගිණුම (ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබූ ප්‍රචාරණ ආදායම් ගැළපීම.)		50,000	50,000

හර **ප්‍රචාරණ ආදායම් ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
XX.12.31	ඉදිරියට ලැබූ ප්‍රචාරණ ආදායම් ගිණුම		50,000	XX.03.01	මුදල්		750,000

හර **ඉදිරියට ලැබූ ප්‍රචාරණ ආදායම් ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
				XX.12.31	ප්‍රචාරණ ආදායම් ගිණුම		50,000

නොමිලේ බෙදහැරීම සඳහා ය.

ඉහත නිදසුන අනුව ඉදිරියට ලැබූ ප්‍රචාරණ ආදායම් නිසා එම ගිණුමේ බැර පැත්තේ දක්වෙන ආදායම, ගිණුම් කාලච්ඡේදයට අදාළ ආදායමට වඩා වැඩි ය. එම නිසා ඉදිරියට ලැබූ ප්‍රචාරණ ආදායම ඉවත් කළ යුතු වේ. එය ප්‍රචාරණ ආදායමෙන් කළ යුතු අඩු කිරීමක් නිසා එම ගිණුමට හර කර ඇත. ඊට අදාළ බැර සටහන දැක්වීම සඳහා ඉදිරියට ලැබූ ප්‍රචාරණ ආදායම් ලෙස නව ගිණුමක් විවෘත කර ඇත. එය වගකීම් ගණයට අයත් වන බව ඔබට පැහැදිලිවනු ඇත.

ක්‍රියාකාරකම 02

අකිලා පොත් මුද්‍රණ කටයුතු පිළිබඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. අකිලාගේ ව්‍යාපාරයේ 20xx.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය වෙනුවෙන් හෙළිදරව් වූ තොරතුරු කිහිපයක් පහත දක්වේ.

i.. 20xx.12.31 දිනෙන් අවසන් වසරට අදාළ විදුලිය වියදම් රු. 2,500ක් ගෙවිය යුතුව ඇත.

ii. ව්‍යාපාරික ගොඩනැගිල්ලෙන් කොටසක් මසකට රු. 2,600 බැගින් 20xx.01.01 දින කුලියට දී ඇත. අවසාන ගිණුම් සකස් කරන 20xx.12.31 දිනය වන විට ගෙවල් කුලී ආදායම් ලෙස ලැබී ඇත්තේ රු. 25,000ක් පමණි.

iii 20xxවර්ෂය සඳහා රක්ෂණ වාරිකය රු. 2,800ක් වුව ද ඒ සඳහා රු.3,000ක් ගෙවා ඇත.

iv. පොත් මුද්‍රණ කටයුතු සඳහා 20xx වර්ෂය තුළ රු.350,000ක මුදලක් ලැබී ඇත. මින් රු. 4,500ක් ඉදිරි වර්ෂය සඳහා අදාළ වේ.

ඉහත සඳහන් ගැළපුම්වලට අදාළ ජ'නල් සටහන් දක්වා ඒවා ලෙජර ගිණුම්වල සටහන් කරන්න.

4.3 නිවැරදි තොරතුරු අනාවරණය සඳහා ණයගැති ශේෂ ගැළපීම

වෙළෙඳ ව්‍යාපාර අත්පිට මුදලට මෙන් ම ණයට ද විකුණුම් කරනු දැකිය හැකි ය. මෙසේ භාණ්ඩ හෝ සේවා ණයට විකිණීමෙන් ණය ගැතියන් බිහි වේ. ණයගැතියන් ව්‍යාපාරයේ වත්කමකි. භාණ්ඩ විශාල වශයෙන් ණයට විකුණන ව්‍යාපාරයක ණය ගැතියන්ගෙන් අය විය යුතු මුදල් ප්‍රමාණය ද විශාල වේ. මේ නිසා ණය ගැතියන් පිළිබඳ ව සුපරික්ෂාකාරී වීම අවශ්‍ය වේ. ව්‍යාපාරයකට ලැබිය යුතු මුදල් නියමිත දිනයට නියම ප්‍රමාණයෙන් ලැබේ ද, නොලත් ප්‍රමාණය කොතෙක් ද යනාදි කරුණු දැන ගැනීමට මෙම සුපරික්ෂාව ඉවහල් වේ.

ණය ගැතියන් පිළිබඳ මනා පාලනයක් පවතින ව්‍යාපාරයක වුව ද ලැබිය යුතු ණය ප්‍රමාණයෙන් කොටසක් නොලැබී යා හැකි ය. මෙලෙස ව්‍යාපාරයට අය විය යුතු මුදල් ලබා ගත නොහැකි වීමෙන් පාඩුවක් ඇති වේ. මෙම පාඩුව වියදමක් ලෙස සැලකෙන අතර එය හැඳින්වෙන්නේ බොල් ණය **(Bad Debts)** යනුවෙනි. මේ අනුව ණය ගැතියන්ගෙන් ස්ථිරව ම නොලැබෙන ණය බොල් ණය ලෙස හැඳින්වේ.

බොල් ණය ඇති වීමට හේතු

ණය ගැතියන්ගෙන් මුදල් නොලැබී යාමට ණය ගැතියා මිය යාම, ණය ගැතියා බුන්වත් වීම යනාදී හේතු දැක්විය හැකි ය.



බොල් ණය ගිණුම් ගත කිරීම

බොල් ණය නිසා ණය ගැතියන් නමැති වත්කමේ අගය අඩු වේ. එම නිසා බොල් ණය වියදමක් / අලාභයක් ලෙස සලකා කටයුතු කළ යුතු වේ. ඊට අදළ ජ'නල සටහන මෙසේය.

බොල් ණය ගිණුම හර
    ණයගැති ගිණුම බැර

බොල් ණය නිසා වියදම් වැඩි වන බැවින් එය බොල් ණය නමැති වියදම් ගිණුමේ හර පැත්තේ සටහන් කරයි. එසේ ම බොල් ණය නිසා ණයගැති නමැති වත්කමේ අගය අඩු වන බැවින් එය ණයගැති ගිණුමේ බැරට සටහන් වන බව ඔබට පැහැදිලිවනු ඇත. බොල් ණය කපා හැරීම ගැළපුම් සටහනක් ලෙස පොදු ජ'නලයේ සටහන් කළ යුතුය.

නිදසුන් ගමිඳු නමැත්තා සඳමාලිගේ ව්‍යාපාරයේ ණය ගැතියෙකි. XX.12.31 දින ඔහුගේ ගිණුමේ ශේෂය රු. 7,500ක් විය. ගමිඳුගේ ව්‍යාපාරය බුන්වත් ව වසා දැමීමට සිදු වු හෙයින් එම ණය මුදල බොල් ණයක් ලෙස කපා හැරීමට තීරණය කරන ලදී.

ඉහත ගනුදෙනු සඳමාලි ව්‍යාපාරයේ පොත්වල සටහන්වන ආකාරය පහත දැක්වේ.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
XX.12.31		බොල් ණය ගිණුම හර ගමිඳුගේ ගිණුම (ගමිඳුගෙන් ලැබිය යුතු ණය බොල් ණය ලෙස කපා හැරීම.)		7,500	7,500

හර **බොල් ණය ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
XX.12.31	ගමිඳු		7,500				

හර **ගමිඳුගේ ගිණුම** බැර

දිනය	විස්තරය	ස පි	වටිනාකම රු	දිනය	විස්තරය	ස පි	වටිනාකම රු
XX.12.31	ශේෂය ඉ/ගෙ		7,500	XX.12.31	බොල් ණය		7,500

බොල් ණය අලාභයක් නිසා එම ගිණුමට හර කරන අතර බොල් ණය නිසා ණය ගැති වත්කම අඩු වීම එම ගිණුමට බැර කළ යුතු ය.

ක්‍රියාකාරකම 03

තිලකවර්ධන මහතා අත්පිට මෙන් ම ණයට ද බඩු විකුණන ව්‍යාපාරිකයෙකි. භාණ්ඩ ණයට විකිණීමෙන් ලැබිය යුතු මුදල රු. 36,000ක් බවත් අත්පිට විකිණීමෙන් ලද මුදල රු. 74,000ක් බවත් ඔහුගේ පොත්පත් පරීක්ෂා කිරීමෙන් දැන ගත හැකි විය.

ණය ගැතියෙකු වූ අමල්ගේ නාස්තිකාර ජීවිතය නිසා ඔහුගේ දේපල විනාශ වී යන එන මං නැති විය. උසාවියෙන් නිකුත් කර ඇති බංකොලොත්භාවය පිළිබඳ තීන්දුවෙන් ද ඒ බව සනාථ විය. ඔහුගෙන් ව්‍යාපාරයට අය විය යුතු මුදල රු. 8,500කි. එම මුදල බොල් ණය ලෙස කපා හැරීමට තීරණය විය.

i. ඉහත ගැටලුව ගිණුම් ගත කිරීමට අදාළ ජ'නල් සටහන් හා ලෙජර ගිණුම් පිළියෙල කරන්න.

ii. මෙම ගැටලුව නිසා ව්‍යාපාරයේ ලාභයට වන බලපෑම කුමක් ද?

නොමිලේ බෙදහැරීම සඳහා ය.

4.4 ස්ථාවර වත්කම්වල වටිනාකම යාවත්කාලීන කිරීම

ව්‍යාපාර ආයතනයක් තම ව්‍යාපාර කටයුතු කර ගෙන යාමේ දී විවිධ වත්කම් උපයෝගී කරගනී. විකිණීමේ පරමාර්ථයකින් තොරව ව්‍යාපාරයක් විසින් දිගු කාලීන භාවිතය සඳහා අත්පත් කර ගනු ලබන වත්කම්වලට නිදසුන් ලෙස,

- ගොඩනැගිලි
- යන්ත්‍රෝපකරණ
- මෝටර් රථ
- ලී බඩු හා උපකරණ
- කාර්යාල උපකරණ ආදිය දැක්විය හැකි ය.

ඉහත නිදසුනෙහි දක් වූ යන්ත්‍රෝපකරණ ව්‍යාපාරයට පාවිච්චි කළ හැකි කාලය වසර 10ක් වීමට පුළුවන. ගිණුම්කරණයේ දී කෙරෙනුයේ එම යන්ත්‍රෝපකරණ සඳහා දරණ ලද වියදම යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන වර්ෂ 10 තුළ දී වියදමක් ලෙස කපා හැරීමයි. මෙහි දී සිදුවන්නේ වත්කමක් ලෙස සටහන් කෙරෙන ප්‍රාග්ධන වියදමක් එම වත්කම් පාවිච්චි කළ හැකි ජීවිත කාලය තුළ දී ක්‍රමයෙන් අයභාර වියදමක් බවට පරිවර්තනය කිරීමයි.

ගිණුම්කරණයේ දී මෙම ක්‍රියාවලිය හැඳින්වෙනුයේ **ක්ෂය කිරීම** **(Depreciation)** යනුවෙනි. මෙසේ ක්ෂය කිරීම අවශ්‍යවන්නේ වසරකට වැඩි ජීවිත කාලයක් ඇති වත්කම් සඳහා පමණි. වත්කමක ක්ෂය වීමට විවිධ සාධක බලපායි.

ක්ෂය වීමට හේතු

වත්කමක අගය අඩු වීම හෙවත් ක්ෂය වීම සඳහා සාධක කිහිපයක් බලපායි. ඒවා අතර පහත දැක්වෙන සාධක දෙක ප්‍රධාන වේ.

I භෞතිකව සිදුවන වැහැරීම
II යල් පැනීම

භෞතිකව සිදු වන වැහැරීම

මෙම සාධකවලට නිදසුන් ලෙස දිරාපත් වීම, වැහැරීම, ඛාදනය වීම හා පාවිච්චියෙන් ගෙවී යාම දැක්විය හැකි ය.

යල් පැනීම

යල් පැනීම යනු වඩා දියුණු හා කාර්යක්ෂම වත්කම් වෙළෙඳ පොළට හඳුන්වා දෙනු ලැබීම නිසා ඇති වන තත්ත්වයකි.

නිදසුන පරිගණක භාවිතයට ගැනීමෙන් යතුරු ලියන කාර්යාල කටයුතුවලින් ඉවත් වීම.

ක්ෂය කළ හැකි ප්‍රමාණය තීරණය කිරීම

යම් වත්කමක් සඳහා ක්ෂය කළ හැකි ප්‍රමාණය යනුවෙන් අදහස් කරන්නේ එම වත්කමේ පිරිවැයෙන්, ආපසු අය කර ගත නොහැකි ප්‍රමාණයයි. වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගණනය කිරීමේ දී පහත සඳහන් සාධක සැලකිල්ලට ගත යුතු ය.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

- පිරිවැය
- ඵලදායි ජීව කාලය
- සුන්බුන් අගය

පිරිවැය	වත්කමක ගැනුම් මිල සහ එය භාවිත තත්ත්වයට ගෙන ඒමට දරන වියදම්වල එකතුව, පිරිවැය වේ.
ඵලදායී ජීව කාලය	යම් කිසි වත්කමකින් ව්‍යාපාරයට ඵලදායී සේවයක් ලැබෙතැයි අපේක්ෂිත කාලය හෝ නිෂ්පාදනය කළ හැකි අපේක්ෂිත ඒකක ප්‍රමාණය එම වත්කමේ ජීව කාලය ලෙස සැලකේ.
සුන්බුන් වටිනාකම	වත්කමක ඵලදායි ජීව කාලය අවසානයේ දී එම වත්කම විකිණීමෙන් ලැබිය හැකි යැයි අපේක්ෂිත ශුද්ධ වටිනාකම සුන්බුන් අගය ලෙස හැඳින්වේ.

ඉහත සඳහන් කරුණු නිශ්චය කළ පසු වත්කමේ ජීවිත කාලය තුළ දී ඇති වන ක්ෂය ප්‍රමාණය තීරණය කළ හැකි ය. ක්ෂය වීම් සඳහා වන ක්‍රමවේදයන් ගිණුම්කරණ ප්‍රමිත තුළින් වඩාත් දීර්ඝ ව සාකච්ඡා කෙරේ.

ක්ෂය කිරීමේ ක්‍රම

වත්කමක් ක්ෂය කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රම කීපයක් ඇත. එම ක්‍රම අතුරින් සරල මාර්ග ක්ෂය ක්‍රමය පමණක් මෙහි දී සැලකිල්ලට ගනී.

සරල මාර්ග ක්ෂය ක්‍රමය **(Straight Line Method)**

වත්කමක ක්ෂය කළ හැකි අගය එහි ඵලදායි ජීවිත කාලය පුරා ඒකාකාරී වටිනාකමකින් කපා හැරීම මෙහි දී සිදු වේ. වත්කමේ පිරිවැයෙන් සුන්බුන් වටිනාකම අඩු කළ විට ක්ෂය කළ හැකි අගය ලැබේ. වත්කමේ ක්ෂය කළ හැකි අගය එහි අපේක්ෂිත ඵලදායී ජීව කාලයෙන් බෙදීමෙන් වාර්ෂික ක්ෂය ප්‍රමාණය ගණනය කිරීම මෙම ක්‍රමය යටතේ සිදු වේ. මෙම ප්‍රමාණය පහත දැක්වෙන ආකාරයට තීරණය කළ හැකි ය.

$$\text{වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය} = \frac{\text{පිරිවැය සුන්බුන් වටිනාකම}}{\text{ඵලදායී ජීව කාලය}}$$

ක්ෂය කළ හැකි අගය = වත්කමේ පිරිවැය සුන්බුන් අගය

ඒ අනුව වාර්ෂික ක්ෂය ප්‍රමාණය පහත සඳහන් පරිදි ද ගණනය කළ හැකි ය.

$$\text{වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය} = \frac{\text{ක්ෂය කළ හැකි අගය}}{\text{ඵලදායී ජීව කාලය}}$$

නිදසුන ව්‍යාපාරයක් 20xx.01.01 දින රු. 300,000කට යන්ත්‍රයක් මිල දී ගෙන ඇත. එම යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය අවුරුදු 08ක් වන අතර, ඇස්තමේන්තු සුන්බුන් අගය රු. 60,000ක් ලෙස ගණන් බලා ඇත. ක්ෂය ගණනය කිරීම සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය භාවිත කෙරේ නම් වාර්ෂික ක්ෂය ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

වාර්ෂික ක්ෂය ප්‍රමාණය	=	$\frac{300,000 \quad 60,000}{8}$	=	$\frac{240,000}{8}$
	=	රු. 30,000		

සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුව වාර්ෂික ක්ෂය ප්‍රමාණය බොහෝ අවස්ථාවල දී ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබේ. මෙම ප්‍රතිශතයෙන් කියවෙන්නේ වියදමක් ලෙස වත්කමේ පිරිවැයෙන් වාර්ෂික ව කපා හැරෙන ප්‍රමාණයයි. අදාළ ක්ෂය ප්‍රතිශතය පහත සඳහන් පරිදි ගණනය කළ හැකි ය.

$$\text{ක්ෂය ප්‍රතිශතය} = \frac{\text{වාර්ෂික ක්ෂය ප්‍රමාණය}}{\text{පිරිවැය}} \times 100$$

මේ අනුව ඉහත සඳහන් නිදසුනේ ක්ෂය ප්‍රතිශතය පහත සඳහන් අයුරු ගණනය කළ හැකි ය.

$$\text{ක්ෂය ප්‍රතිශතය} = \frac{30,000}{300,000} \times 100$$

$$= 10\%$$

ක්ෂය ගිණුම් ගත කිරීම

යම් වත්කමක වාර්ෂික ක්ෂය ප්‍රමාණය එම වත්කමේ පිරිවැයෙන් එම වසරට අදාළ වියදමක් ලෙස කපා හළ යුතු ය. මේ සඳහා වියදම් ගිණුමක් ආරම්භ කෙරෙන අතර එය අදාළ **වත්කම සඳහා වූ ක්ෂය ගිණුම** ලෙස හැඳින්වේ. ඊට අදාළ ද්විත්ව සටහන මෙසේ ය.

අදාළ ක්ෂය ගිණුම හර

ක්ෂය වෙන්කිරීමේ ගිණුම බැර

කාලච්ඡේදයට අදාළ ක්ෂය ප්‍රමාණය, වියදමක් ලෙස සලකන බැවින් එය ක්ෂය ගිණුමේ හර පැත්තේ සටහන් කරයි. මෙයට අදාළ බැර සටහන අදාළ වත්කම් ගිණුමේ බැර පැත්තේ විය යුතු බව ඔබට එක්වර ම පෙනී යනු ඇත. එසේ වුව ද වෙනම ක්ෂය වෙන්කිරීමේ ගිණුමක එය සටහන් කරයි. ඒ අනුව **ක්ෂය වෙන්කිරීමේ ගිණුම** නමින් අලුත් ගිණුමක් විවෘත කොට බැර සටහන එහි ඇතුළත් කරනු ලැබේ.

ඉහත ව්‍යාපාරයේ යන්ත්‍රය ක්ෂය වීම සම්බන්ධව කළ යුතු ජ'නල සටහන පහත දැක්වේ.

පොදු ජ'නලය

දිනය	වවුචර අංකය	විස්තරය	ලෙ. පි	හර රු.	බැර රු.
XX.12.31		යන්ත්‍ර ක්ෂය ගිණුම හර යන්ත්‍ර ක්ෂය වෙන්කිරීමේ ගිණුම (වාර්ෂික යන්ත්‍ර ක්ෂය ප්‍රමාණය සටහන් කිරීම)		30,000	30,000

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ඉහත ජ'නල් සටහනෙහි දැක්වෙන ක්ෂය වෙන්කිරීමේ ගිණුම එම අයුරින් ම වත්කමේ ඵලදායී ජීව කාලය අවසාන වනතෙක් ම සෑම වර්ෂයක් අවසානයේ දී ම මේ අන්දමට කළ යුතු වේ. ක්ෂය වීමට අදාළ ලෙජර ගිණුම් පහත දැක්වෙන පරිදි වේ.

හර **යන්ත්‍ර ගිණුම** බැර

දිනය	විස්තරය	සපි	වටිනාකම රු	දිනය	විස්තරය	සපි	වටිනාකම රු
XX.01.01	මුදල්		300,000				

හර **යන්ත්‍ර ක්ෂය ගිණුම** බැර

දිනය	විස්තරය	සපි	වටිනාකම රු	දිනය	විස්තරය	සපි	වටිනාකම රු
XX.12.31	යන්ත්‍ර ක්ෂය වෙන්කිරීමේ ගිණුම		30,000				

හර **යන්ත්‍ර ක්ෂය වෙන්කිරීමේ ගිණුම** බැර

දිනය	විස්තරය	සපි	වටිනාකම රු	දිනය	විස්තරය	සපි	වටිනාකම රු
				XX.12.31	යන්ත්‍ර ක්ෂය ගිණුම		30,000

ක්‍රියාකාරකම 04

මොහොමඩ් සිමෙන්ති ගල් නිෂ්පාදන ව්‍යාපාරයක් ඇරඹීම සඳහා 20XX.01.01 දින යන්ත්‍රයක් රු.150,000කට මිල දී ගන්නා ලදී. එහි අපේක්ෂිත ජීව කාලය අවුරුදු 16ක් වන අතර, ඇස්තමේන්තු සුන්බුන් අගය රු.30,000ක් ලෙස ද ගණන් බලා ඇත.

මොහොමඩ් ඔබගෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු අපේක්ෂා කරයි.

i. ක්ෂයවීම් වියදමක් ලෙස සලකන්නේ ඇයි ?
ii. වත්කමක පිරිවැය, ඵලදායී ජීව කාලය, සුන්බුන් අගය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද ?
iii. මෙම යන්ත්‍රයේ අගය අඩු වීමට හේතු විය හැකි කරුණු මොනවා ද ?
iv සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුව ක්ෂය කරනුයේ නම්
(අ) අදළ වාර්ෂික ක්ෂය වීම් ප්‍රමාණය ගණනය කිරීම.
(ආ) 20xx වර්ෂය සඳහා ක්ෂයවීම් ගිණුම් ගත කිරීමට අදළ ජ'නල් සටහන හා ලෙජර ගිණුම් දැක්වීම.

ක්‍රියාකාරකම 05

සදීප්ත සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ඔහුගේ ව්‍යාපාරයේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

1. 20xx.01.01 දිනට ස්ථාවර වත්කම්

ඉඩම් හා ගොඩනැගිලි	(පිරිවැයට)	රු. 250,000
ලී බඩු උපකරණ	(පිරිවැයට)	රු. 80,000
රථවාහන	(පිරිවැයට)	රු. 100,000

2. ඔහු තම ව්‍යාපාරය කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යයි. මාසික කුලිය රු. 2,000කි. වර්ෂය තුළ කුලිය වශයෙන් ගෙවා ඇත්තේ රු. 16,000කි.
3. සදීප්ත ප්‍රචාරණ වියදම් සඳහා ජූනි 01 දින රු. 24,000ක් මුදල් ගෙවා ඇත. මෙම මුදලින් රු. 12,000ක් ඉදිරි වර්ෂය සඳහා දරන ලද වියදම් ය.
4. අජිත් නැමැති රු. 5,000ක ණය ගැතියෙකු හදිසියේ මිය යෑම නිසා ඔහුගෙන් ලැබිය යුතු ණය කපා හැරීමට තීරණය කරන ලදී. 20xx.01.01 දිනට ණය ගැතියෝ ශේෂය රු. 28,000 ක් විය.
5. සදීප්ත තම ව්‍යාපාරයේ රථය ගනුදෙනු කරුවන්ගේ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා යොදවයි. මෙමගින් වර්ෂය තුළ දී ලැබූ ආදායම රු. 24,000කි. මින් රු. 4,000ක් ඉදිරි වර්ෂය සඳහා ලැබූ මුදල් ය.
6. ව්‍යාපාරය ඉඩම් හා ගොඩනැගිලි, ලී බඩු උපකරණ සහ රථවාහන සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව පිළිවෙලින් 10%, 5%, 20% බැගින් ක්ෂය කරයි.

ඔබ විසින්

i. 20xx.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාළ වන ගැළපුම් සටහන් පොදු ජ'නලයක් මගින් ඉදිරිපත් කරන්න.

ii. ගනුදෙනු ලෙජරයට පිටපත් කරන්න.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.